බස්නාහිර පළාතේ 2014 අංක 04 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

නම් වූ

මෙම ප්‍රඥප්තිය

2014 සැප්තැම්බර් මස 23 වන දින පැවති

බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීමේදි

සභා සම්මත වූ බව

සහතික කරමි.

දිනය: 2014.11.03

සුනිල් විජේරත්න
සභාපති
බස්නාහිර පළාතේ පළාත් සභාපති,
5 වන මහල, බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.11.05

දිනය:

එස්.අලවි මව්ලානා,
ආණ්ඩුකාරවර,
බස්නාහිර පළාත.

බස්නාහිර පළාතේ 2014 අංක ..04....... දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය

2010 අංක 02 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 06 දරන බස්නාහිර පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

කෙටි නාමය සහ දීර්ඝ නාමය සංශෝධනය කිරීම

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2014 අංක ..04.. දරන මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

02. ප්‍රධාන ප්‍රඥප්තියේ දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝනාමය ඇතුළත්කර සංශෝධනය කරනු ලැබේ :-

මේ ප්‍රඥප්තිය, සංශෝධිත වූ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත, සංශෝධිත පරිදි වූ 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත, සංශෝධිත පරිදි වූ සුරාබදු ආඥා පනත, සංශෝධිත පරිදි වූ 1957 අංක 37 දරණ තෑගි තරඟ පනත, සංශෝධිත පරිදි වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 05 දරන සමුපකාර සමිති පනත, සංශෝධිත පරිදි වූ මහ නගර සභා ආඥා පනත, සංශෝධිත පරිදි වූ නගර සභා ආඥා පනත සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යන පනත්හි ඇතැම් විධිවිධාන අනනුකූල වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ XXIX පරිච්ඡේදය සඳහා නව වගන්ති ආදේශ කිරීම

03. මෙහි පහත දැක්වෙන පරිච්ඡේද අංකය, පරිච්ඡේද නාමය සහ වගන්ති පිළිවෙලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වගන්තියට ඉක්බිතිවම ඇතුළත් කරනු ලබන අතර ඒවා XXIX අ වන පරිච්ඡේදය, ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු 97 අ සහ 97 ආ වගන්ති ලෙස බලපවත්වන්නේ ය.

## XXIX අ වන පරිච්ඡේදය
## ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු

ජාතිය ගොඩනැගීමේ බද්ද පළාත් සභා අරමුදලට බැරකළ යුතු බව

97 අ 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනතේ 10 වගන්තියේ විධිවිධාන පරිදි දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ජාතිය ගොඩනැගීමේ බද්ද ලෙස එකතු කරන ලද මුළු මුදලින් සියයට තිස්තුනයි තුනෙන් එකක මුදලින් අයවැය අවශ්‍යතාවයන් සළකා මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් දැනුම්දෙන පරිදි නියමිත ප්‍රතිශතය බස්නාහිර පළාත් සභා අරමුදලට බැරකළ යුතු ය.

මධ්‍යම රජයේ මුද්දර ගාස්තු පළාත් සභා අරමුදලට බැරකළ යුතු බව

97 ආ දේශිය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, 2011 අංක 13 දරන පළාත් සභා මුද්දර ගාස්තු මාරුකිරීමේ පනතේ දෙවෙනි වගන්තියේ විධිවිධාන පරිදි 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත ප්‍රකාරව, ආණ්ඩුව විසින් මුද්දර ගාස්තු වශයෙන් එකතු කර ගන්නා ලද සියළු ආදායම්, එම ආදායම එකතු කරගනු ලැබූ පදනම මත බස්නාහිර පළාත් සභා අරමුදලට බැර කළ යුතු ය.

අනනුකූලතාවයක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

04. මෙම ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.